# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. 

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2026.03.03


පී.කේ.ජී.නිලන්ති චන්ද්‍රිකා විජේවර්ධන
අංක 174, මැදගම,
දේවගල.

පැමිණිලිකාර පාර්ශවය

එච්.විමල් වසන්ත රාජා
අංක 174, මැදගම,
දේවගල

වින්දිත පාර්ශවය

01. ආර්.එම්.එස්.සී.රත්නායක
පොලිස් පරීක්ෂක
ස්ථානාධිපති
පොලිස් ස්ථානය, වැලිකන්ද
(දැනට වැඩ තහනමකට ලක්ව ඇත.)

02. ඩබ්ලිව්.ජී.කේ.වීරසිංහ
උප පොලිස් පරීක්ෂක
පොලිස් ස්ථානය, වැලිකන්ද

03. ඩබ්ලිව්.එම්.සී.එස්.වීරසිංහ
පොලිස් සැරයන් 39210
පොලිස් ස්ථානය, වැලිකන්ද
(වර්තමාන සේවා ස්ථානය : පොලිස් ස්ථානය,මැදිරිගිරිය)

04. ටී.ඩී.බුද්ධික නයන පියසේන
පොලිස් සැරයන් 2952
පොලිස් ස්ථානය, වැලිකන්ද

05. පී.ආර්. චමින්ද අතුල කුමාර
පොලිස් කොස්තාපල් 61716
පොලිස් ස්ථානය, වැලිකන්ද

06. ටී.ජී. ටිකිරිබණ්ඩා
පොලිස් සැරයන් 50650
පොලිස් ස්ථානය, වැලිකන්ද

වගඋත්තරකාර පාර්ශවය


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82

ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**<u>පැමිණිලි අංකය: HRC/ANU/142/2024(A)</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකාර පී.කේ.ජී. නිලන්ති චන්ද්‍රිකා විජේවර්ධන යන අය විසින් 2024.03.25 වන දින කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2024.03.21 දින සවස 3.30 ට පමණ වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා යැයි පැවසූ අයෙකු සමඟ තවත් නිලධාරීන් කණ්ඩායමක් තම නිවසට පැමිණි බවත්, වී ලොරියක් අතුරුදන් වීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට යැයි කියමින්, තම ස්වාමි පුරුෂයා වන එච්. විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලද බවත් ය. එදිනම එනම්, 2024.03.21 වන දින රාත්‍රී 7.00 ට පමණ තම සහෝදරයින් දෙදෙනා විසින් වැලිකන්ද පොලිස් ස්ථානය වෙත ගොස් තම ස්වාමි පුරුෂයා ආහාරපාන ලබා දී නිවසට පැමිණි බවත්, සහෝදරයින් දෙදෙනා පොලිස් ස්ථානයේ සිටියදීම ස්ථානාධිපතිවරයා විසින් තම ස්වාමි පුරුෂයාව සිර මැදිරියට දමන ලෙස නියෝග කර ඇති බවත්, එම අවස්ථාවේදී පොලිස් නිලධාරියෙකු පැමිණ ස්වාමි පුරුෂයාව සිර මැදිරියට දැමූ බව සහෝදරයින් දෙදෙනා තමා හට පවසා සිටි බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

ඉන් පසුව සහෝදරයින් දෙදෙනා පිටව ගිය බවත්, එදින එනම්, 2024.03.21 වන දින රාත්‍රී 11.00ට පමණ තමාගේ එක් සහෝදරයෙකුට වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරියෙකු දුරකථන ඇමතුමක් ලබාදී තම ස්වාමි පුරුෂයා පොලිස් ස්ථානයේ ඉහළ මහලෙන් බිමට පැන්න බව පවසා ඇති බවත්, එම නිලධාරියා විසින් තම ස්වාමි පුරුෂයාගේ නම සහ ලිපිනය කුමක්ද කියා විමසා ඇති බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. එසේම, ඊට පසු දින එනම්, 2024.03.22 වන දින උදෑසන වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තම නිවසට පැමිණ, තම ස්වාමි පුරුෂයාව, අනුරාධපුර මහ රෝහල වෙත හිසේ සැත්කමක් සඳහා රැගෙන ගිය බව පවසා සිටි බවද පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

2024.03.21 වන දින සවස පොලිස් නිලධාරීන් සමඟ තම නිවසින් ඉතාමත් හොඳින් පිටව ගිය තම ස්වාමි පුරුෂයාට වැලිකන්ද පොලිස් ස්ථානයේ නිළධාරින් විසින් සිදු කළ එම අපරාධය නිසා තම ස්වාමි පුරුෂයා දැඩි ලෙස රෝගාතුර වීම හේතුවෙන් පැමිණිලිකාරිය සහ ඔවුන්ගේ දරුවන් දෙදෙනා දැඩි අසරණ තත්ත්වයට පත්වී සිටින බවත්, ගොවියෙකු වන තම ස්වාමි පුරුෂයා රෝගී වීම හේතුවෙන් ඔහුහට රැකියා කටයුතු සිදු කිරීමට නොහැකි වීමෙන් ඔවුන් ආර්ථික වශයෙන් දැඩි අපහසුතාවයන්ට මුහුණ පා සිටින බවත් පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේහෙයින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකොට තමා හට සාධාරණයක් ඉටු කර දෙන ලෙස පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

## වින්දිත පාර්ශවයේ කරුණු දැක්වීම

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය ප්‍රකාශ කර සිටින්නේ, 2024.03.21 වන දින සවස 3.00ට පමණ තම බිරිඳ හා දරුවන් සමඟ නිවසේ සිටින විටදී වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් යැයි කියාගත් පිරිසක් තම නිවසට පැමිණි බවත්, එසේ පැමිණි නිලධාරීන් විසින් ප්‍රදේශයේ සිදුවී ඇති වී සොරකමක් සම්බන්ධව ප්‍රකාශයක් ලබා ගැනීමට යැයි පවසමින් තමා වැලිකන්ද පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් ය. එසේ රැගෙන ගොස් එදින රාත්‍රී 7.00ට පමණ එක් නිලධාරියෙකු තමාගෙන් විස්තර ලබා ගත් බවත්, එම අවස්ථාවේදී ස්ථානාධිපතිතුමා පැමිණ තමා සිර මැදිරියට දමන්න යැයි කියා පිටව ගිය බවත්, ඉන් පසුව එම පොලිස් නිලධාරීන් තමාව සිර මැදිරියට දමන ලද බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

එසේම, තමා සිර මැදිරියේ සිටියදී තමාව නිවසේ සිට පොලිස් ස්ථානයට රැගෙන ආ පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු පැමිණ තමාව සිර මැදිරියෙන් පිටතට ගත් බවත්, එසේ පිටතට ගෙන තම අත් දෙකට මාංචු දමා පොලිස් ස්ථානයේ ඉහළ මහලට රැගෙන ගිය බවත්, එසේ ඉහළ මහලට යාමට පඩි පෙළ නගින විට දී පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා තමාගේ බෙල්ලෙන් අල්ලා තම දකුණු කණට පහරදීමක් සිදු කරන ලද බවත් වින්දිත පාර්ශවය විසින් දක්වා ඇත. පසුව ඉහළ මහලේ පොඩි ශාලාවක් ඇතුලට තමා රැගෙන ගිය බවත්, තමාට හිඳ ගැනීමට පුටුවක් ලබාදුන් බවත්, ප්ලාස්ටික් කොප්පයකට අරක්කු දමා තමා හට බොන්න යැයි පැවසූ බවත්, තමා අරක්කු බීවේ නැති බවත්, පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් අරක්කු බිවූ බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත. තවද, පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියාගේ අතෙහි බටයක් තිබූ බවත්, එම බටයෙන් තමාගේ පිටට පහර දෙන ලද බවත්, ඉන් පසු පොතක් ලබා දී අත්සන් කරන්න යැයි තමාට පැවසූ බවත්, තමාට පේන්නේ නැති බව පැවසූ විට පරුෂ වචනයෙන් බැන වැදී පොතෙන් ඔළුවට හා පිටට පහරදුන් බවත්, ඊට පසු පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් තමාගේ බෙල්ලෙන් අල්ලාගෙන තමා සිටි තැන තිබූ කණුවේ තම ඔළුව ගැසූ බවත්, එම අවස්ථාවේදී ඔළුව හිරි වැටුණු බවත්, තම ඇස් දෙක නොපෙනී ගිය බවත්, පසුව උඹට අත්සන් කරන්න බැරිද යනුවෙන් පවසා තමාට පයින් ගැසූ බවත්, පයින් ගැසූ පාරට තමාව කොහේට වැටුණා ද කියා තමා දන්නේ නැති බවත්, ඊට පසු සිදුවුණු දේවල් තමා නොදන්නා බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

### වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම

### 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරික්ෂක ආර්.එම්.එස්.සී. රත්නායක යන අයගේ කරුණු දැක්වීම

වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරික්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක යන අය විසින් කොමිෂන් සභාව වෙත අංක 1106/2024 සහ 2024.05.15 දිනැති වාර්තාවක් යොමු කරමින් දන්වා සිටින්නේ, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය 2024.03.21

වන දින පැය 16.15ට තමා, උප පොලිස් පරීක්ෂක වීරසිංහ, පො.සැ. 39210 වීරසිංහ, පො.සැ. 2952 බුද්ධික සහ සි.අ.බ. M 023546 දිල්හාර යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති බවත්, ඔහුට පහරදීමක් සිදුකර නොමැති බවත්, පැමිණිලිකරුට එරෙහිව පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත අංක ම/උ බී 311/2024/02 යටතේ කරුණු වාර්තා කර ඇති බවත් ය.

මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව වෙත පාර්ශව කැඳවා 2024.09.03 වන දින පරීක්ෂණයක් සිදුකරන ලද අතර, එම පරීක්ෂණයේදී ස්ථානාධිපතිවරයා ප්‍රකාශ කර ඇත්තේ, 2024.03.20 වන දින දාහතර ලක්ෂ පනස් එක් දහස් නවසිය හැට තුනක් පමණ වටිනා වී පටවන ලද ලොරි රථයක් සොරකම් කිරීම සම්බන්ධව පැමිණිල්ලක් පොලිස් ස්ථානය වෙත ලද බවත්, එම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීම සඳහා අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ජී.කේ.වීරසිංහ යන අය වෙත භාරදුන් බවත්, ඒ අනුව විමර්ශනය සිදුකරන ලද බවත්, මෙම විමර්ශනය සඳහා තමාද සහභාගී වූ බවත් ය. එසේම, තමා අදාළ සොරකම සිදු වූ ස්ථානයට පිටව ගොස් එහි නිරීක්ෂණ සටහන් යොදන ලද බවත්, අදාළ ස්ථානයේ සවිකර තිබූ සී.සී.ටී.වී.කැමරා දර්ශනද පරීක්ෂා කළ බවත්, එලෙස සී.සී.ටී.වී.දර්ශන පරීක්ෂා කිරීමේදී අදාළ තොරතුරු අනාවරණය කර ගත් බවත්, ඒ අනුව විමර්ශනය තවදුරටත් සිදුකළ බවත්, එකී විමර්ශන අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය අදාළ සොරකමට සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වූ බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරුව 2024.03.21 වන දින පැය 16.15ට වරද කියා දී අත්අඩංගුවට ගත් බවත්, 2024.03.21 වන දින පැය 17.45ට වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය උපසේවයට භාරදුන් බවත් ස්ථානාධිපතිවරයා විසින් සඳහන් කර ඇත.

2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ යන නිලධාරියා විසින් ද 2024.09.03 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ඉහත සඳහන් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කරන ලද කරුණු හා සමාන කරුණු ඉදිරිපත් කර ඇත.

**3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ යන අයගේ කරුණු දැක්වීම**

පොලිස් සැරයන් 39210 වීරසිංහ යන අය ප්‍රකාශ කර සිටින්නේ, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය අත්අඩංගුවේ සිටියදී තමා විසින් මෙම පැමිණිලිකරු සහ ඔහු සමඟ අත්අඩංගුවට ගත් අසංක කුමාර වික්‍රමසිංහ යන අයව ප්‍රකාශ සටහන් කිරීම සඳහා උප සේවයේ අවසර ඇතිව අපරාධ අංශයට රැගෙන ගිය බවත්, තමා මෙම සැකකරුවන් භාර ගන්නා අවස්ථාවේදී උප සේවක නිලධාරියා තමාට දන්වා සිටියේ, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා විසින් සිර මැදිරියේ සිටියදී ඔහුට මිය යාමට අවශ්‍ය බව කියමින් සිර මැදිරිය තුළදී හැසිරුණු බවත්, එම සිර මැදිරියේ සිටි සැකකරුවන් දෙදෙනෙකු විසින් ඒ බව උප සේවයට දන්වා තිබූ බවත් ය.

එසේම, සැකකරුවන් දෙදෙනා එකිනෙකා ඉදිරියේ ප්‍රශ්න කිරීම නොකළ යුතු බැවින් අසංක කුමාර වික්‍රමසිංහ යන අයව අපරාධ අංශයේ පොලිස් සැරයන් 51096 රත්නායක භාරයේ තබා මෙම පැමිණිලිකරුව තමා හා පොලිස් සැරයන් 2952 බුද්ධික නිලධාරියා සමගින් පැමිණිලිකරුගේ අත්දෙක පිටුපසට කර අත්මාංචු දමා උඩු මහලේ ඇති දේශන ශාලාවට රැගෙන යන ලද බවත්, පඩි පෙළේ තිදෙනාට එකවර ගමන් කිරීම අපහසු බැවින් තමා ඉදිරියෙන්ද, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා තමා පිටුපසින්ද, සැකකරු පිටුපසින් පොලිස් සැරයන් 2952 බුද්ධික නිලධාරියා ද ගමන් කළ බවත් 3 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද, පඩිපෙළේ ඉහළට ගමන් කර උඩට පැමිණෙනවාත් සමඟම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය එකවරම වම්පසට හැරී අත්වැටට නැමී බිමට පනින ලද බවත්, ඔහුගේ පැනීම වළක්වා ගැනීම සඳහා පොලිස් සැරයන් 2952 බුද්ධික නිලධාරියා උත්සාහ කළ ද, ඔහුව වළක්වා ගැනිමට නොහැකි වූ බවත්, තමා ඇතුළු පිරිස පහළට බැස බලන ලද බවත්, එවිට ඔහු සිහිසුන්ව වැටී සිටිනු දුටු බවත්, ඒ අනුව ඔහුව වහාම වැලිකන්ද රෝහලට රැගෙන ගිය බවත්, මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයට තමා පහරදීමක් කර නැති බවත්, පහරදීමේ චෝදනාව ප්‍රත්ක්ෂේප කරන බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

## <u>4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන අයගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිස් සැරයන් 2952 බුද්ධික යන අය ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අයව සොරකමකට අදාළව 2024.03.21 වන දින අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර තිබූ බවත්, මෙම අපරාධයට අදාලව අත්අඩංගුවට ගෙන ස්ථානය වෙත ඉදිරිපත් කර තිබූ අසංක කුමාර වික්‍රමසිංහ යන සැකකරු ද සිටි බවත්, මෙම සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සඳහා පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් 2024.03.21 දින පැය 10.17ට පමණ ඔවුන් රඳවා සිටි සිර මැදිරියෙන් උප සේවයට දන්වා භාරගෙන අපරාධ විමර්ශන අංශය වෙත රැගෙන ආ බවත් ය.

එසේම, සැකකරුවන් දෙදෙනාම එකම ස්ථානයේ තබා ප්‍රශ්න කිරීමෙන් සාර්ථක තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි බැවින් අසංක කුමාර වික්‍රමසිංහ යන සැකකරුව පොලිස් සැරයන් 51096 රත්නායක යන නිලධාරියා භාරයේ අපරාධ අංශයේ තබා පොලිස් සරයන් 39210 වීරසිංහ නිලධාරියා සමඟ තමා ප්‍රධාන සැකකරු වන එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය රැගෙන පොලිස් ස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉහළ මාළයේ දේශන ශාලාවට රැගෙන ගිය බවත්, මෙම සැකකරුගේ දැත් පිටුපසට කර අත්විලංගු යොදා ඉහළ මාලයට පිවිසීමට ඇති පඩිපෙළ අසළට තමා සහ පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා සැකකරුගේ දෙපසින් ගොස් පඩිපෙළෙහි තිදෙනෙකුට එක්වර ගමන් කළ නොහැකි බැවින්, පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා සැකකරුගේ ඉදිරියෙන්ද, සැකකරු මැදින් සහ තමා සැකකරුගේ පිටුපසින් ඉහළ මහළ තෙක් පඩිපෙළේ ගමන් කළ බවත් 4 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, පඩිපෙළේ සිට දෙවෙනි මහළට පිවිසෙනවාත් සමගම වම්පසට ඇති අත්වැට අසළට ඉතා ක්ෂණිකව පිවිස මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අය ඔහුගේ හිස පහළට හරවා ඉහළ මාහලේ සිට පහළ මහළට පනින ලද බවත්, එම අවස්ථාවේ දී තමා සමඟ පෙලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා පැමිණිලිකරුව පහළට වැටීම වැළැක්වීමට උත්සාහ කළ ද ඔහුගේ දේහ ප්‍රමාණය අනුව අතින් ගිලිහී ඔහු පහත පඩිපෙළ මතට පතිත වූ බවත්, ඔහු සිහිසුන්ව වැටී සිටි බැවින් වැලිකන්ද රෝහල වෙත රැගෙන ගිය බවත්, වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අයට පහරදුන් බවට කරන පැමිණිල්ල තමා ප්‍රතික්ෂේප කරන බවත්, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය ඉහළ මාළයේ සිට පහළ මාළයට පැනීම හේතුවෙන් සිහිසුන්ව රෝහල් ගත කිරීමට සිදු වූ බවත් 4 වන වගඋත්තරකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

**<u>5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල යන අයගේ කරුණු දැක්වීම</u>**

2025.08.26 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2024.03.21 වන දින තමා උප සේවය භාර නිලධාරියා වශයෙන් කටයුතු කළ බවත්, එදින පැය 22.15ට පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් දෙදෙනා විසින් අත්අඩංගුවට ගත් සැකකරු වන එච්. විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය උපසේවයට භාරදෙනු ලැබූ බවත්, එම සැකකරු සිරමැදිරියට ඇතුළු කරන අවස්ථාවේදී එහි තවත් සිරකරුවන් දෙදෙනෙකු සිටි බවත් ය. එලෙස සැකකරුවන් සියලු දෙනා සිර මැදිරියේ සිටින අවස්ථාවේදී ඉහත කී සිරකරුවන් දෙදෙනා තමාට කථා කර එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය විසින් ඔහු හට මැරෙන්න අවශ්‍ය බව පවසා සිරමැදිරියේ වාතාශ්‍රය ලැබීමට සකසා ඇති කම්බි දමා සකස් කර ඇති කවුලුවේ එල්ලීමට සූදානම් වන බව පැවසූ බවත්, එම අවස්ථාවේ දී එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අයව අත්අඩංගුවට ගත් පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් දෙදෙනා සිරමැදිරිය අසලට පැමිණ සිටි බවත්, අනතුරුව පොලිස් සැරයන් 39210 වීරසිංහ යන නිලධාරියා විසින් "මැරෙන්න හදන්න එපා, මේක අධිකරණයෙන් විසඳගන්න පුළුවන්" යනුවෙන් සැකකරු හට පැවසූ බවත් 5 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

ඉන් අනතුරුව පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් දෙදෙනා විසින් එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අයව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පොලිස් ස්ථානයේ උඩ තට්ටුවට රැගෙන ගිය බවත්, ඒ සමගම "සැකකරු පැන්නා" යනුවෙන් කෑගසන ශබ්දයක් තමාට ඇසුණු බවත්, ඒ වේලාවේ සැකකරු ඉහළ මාලයට රැගෙන ගිය පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් දෙදෙනා කෑගසමින් පහළට පැමිණි බවත්, තමා සහ කාර්යභාර නිලධාරී ද ඒ දෙසට දිව ගිය බවත්, එම

අවස්ථාවේ දී සැකකරු වන එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය පඩිපෙළ පාමුල වැටී සිටි බවත්, ඒ වේලාවේ දී ස්ථානාධිපතිතුමා නිල කාමරයේ රැඳී සිටි බැවින් ඔහු හට ඒ පිළිබඳව දැනුම් දුන් බවත්, අනතුරුව ස්ථානාධිපතිතුමා විසින් නිලධාරීන් සමඟ සැකකරු රෝහල වෙත රැගෙන ගිය බවත් 5 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

**<u>6 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 50650 ටිකිරිබණ්ඩා යන අයගේ කරුණු දැක්වීම</u>**

2025.08.26 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 6 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 50650 ටිකිරිබණ්ඩා යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2024.03.21 වන දින තමා කාර්යභාර නිලධාරියා වශයෙන් කටයුතු කළ බවත්, එදින රාත්‍රී 10ට පමණ ආහාර ගැනීම සඳහා තමා භෝජනාගාරය වෙත ගිය බවත්, ආහාරගෙන තමා නැවත පැමිණි විට සිරමැදිරියේ සිටි සැකකරුවෙකු වන එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අයව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා උඩු මහලට රැගෙන ගිය බව විෂයභාර නිලධාරී තමා හට ප්‍රකාශ කළ බවත් ය.

එසේම, ඒ ආසන්න වේලාවේ දී උඩු මහලෙන් "සැකකරු වැටුණා" යනුවෙන් කෑගසන ශබ්දයක් ඇසුණු බවත්, තමා සහ උප සේවය භාර නිලධාරී ද ඒ දෙසට දිව ගිය බවත්, එම අවස්ථාවේ දී සැකකරු වන එච්.විමල් වසන්ත රාජා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය පඩිපෙළ පාමුල වැටී සිටි බවත්, ඒ වේලාවේ දී ස්ථානාධිපතිතුමා නිල කාමරයේ රැඳී සිටි බැවින් ඔහු හට ඒ පිළිබඳව දැනුම් දුන් බවත්, අනතුරුව ස්ථානාධිපතිතුමා විසින් නිලධාරීන් සමඟ සැකකරු රෝහල වෙත රැගෙන ගිය බවත් 6 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

**<u>නිරීක්ෂණ</u>**

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අය කියා සිටින්නේ, තමාව අත්අඩංගුවටගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඔහුට පහරදී වධහිංසා කර වගඋත්තරකරුවන් විසින් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් අනුව කරන ලද විමර්ශනයෙන් අනාවරණය කර ගන්නා ලද කරුණුවලට අනුව වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අය නීත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගෙන ඇති බවත්, ඔහුට කිසිදු ආකාරයේ පහරදීමක් හෝ වධහිංසාවක් සිදුකර නොමැති බවත්, ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයට වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති බවත් ය.

වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.20 දින පැය 17.20ට පිටුව 192 සහ ඡේදය 76 යටතේ රුපියල් 1,451,963.00ක් වටිනා වී පටවන ලද ලොරි රථයක් සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් සටහන් වී ඇති බව නිරීක්ෂණය වේ. මෙම පැමිණිල්ලේ විමර්ශන කටයුතු සඳහා 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ

(වැලිකන්ද පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති), 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ පොලිස් සැරයන් 51096 රත්නායක යන නිලධාරීන් පිටව ගොස් ඇති බව වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.20 දින පැය 17.30ට පිටුව 195 සහ ඡේදය 77 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එසේම, වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.20 දින පැය 17.35ට පිටුව 195 සහ ඡේදය 78 යටතේ යොදා ඇති සටහන අනුව මෙම පැමිණිල්ලේ විමර්ශන කටයුතු සඳහා 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරික්ෂක ආර්.එම්.එස්.සී. රත්නායක යන අය, 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික සහ පොලිස් සැරයන් 23789 අත්තනායක යන නිලධාරින් සමඟ පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරික්ෂක ආර්.එම්.එස්.සී. රත්නායක යන අය විසින් වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.20 දින පැය 22.10ට පිටුව 196 සහ ඡේදය 79 යටතේ යොදා ඇති පැමිණීමේ සටහන අනුව, ඉහත කී සොරකමට අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර ඇති බවත්, මෙම විමර්ශනයේදී ලද තොරතුරකට අනුව අදාළ වී පටවා තිබූ ලොරි රථය අරලගංවිල මාර්ගයේ මනම්පිටිය බල ප්‍රදේශයේ 4 කණුව ආසන්නයේ දමා ගොස් ඇති බවට කරුණු අනාවරණය වී ඇති බවත්, ඒ අනුව එම ස්ථානය වෙත ගොස් විමර්ශනය සිදුකිරීමේදී යතුර සමඟ දමාගොස් තිබූ ලොරි රථය හමු වී ඇති බවත්, එම ලොරි රථයේ වී මිටි කිසිවක් නොතිබූ බවත්, ඒ අනුව තවදුරටත් විමර්ශන ආරම්භ කර ඇති බවත්, එම විමර්ශනයේදී සී.සී.ටී.වී.දර්ශන පරික්ෂා කරන ලෙස 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ නිලධාරියා වෙත උපදෙස් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

එමෙන්ම, වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.20 දින පැය 23.35ට පිටුව 199 සහ ඡේදය 80 යටතේ යොදා ඇති 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ නිලධාරියාගේ පැමිණීමේ සටහන අනුව විමර්ශනයේදී අදාළ අපරාධය සිදුවූ ස්ථානයේ සී.සී.ටී.වී.කැමරා පද්ධතියක් සවිකර තිබූ බැවින්, එම සී.සී.ටී.වී.කැමරා පද්ධතිය පරීක්ෂා කර ඇති බවත්, පැය 20.21 ට පමණ ලොරි රථය අදාළ ස්ථානයෙන් රැගෙන යාම පිළිබඳව දර්ශන නරඹා ඇති බවත්, එම ලොරිය සිංහපුර වැලිකන්ද දෙසට රැගෙන යනු නිරීක්ෂණය වී ඇති බවත්, එම සී.සී.ටී.වී.දර්ශන පදනම් කරගෙන ලොරි රථය සොයා ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.21 දින පැය 17.45ට පිටුව 211 සහ ඡේදය 88 යටතේ යොදා ඇති 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරික්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක යන නිලධාරියාගේ පැමිණීමේ සටහන අනුව, මෙම අපරාධය සම්බන්ධයෙන් ලද සී.සී.ටී.වී.දර්ශන ඔස්සේ ලබාගත් ඡායාරූප හා තොරතුරු අනුව අදාළ සැකකරු සොයා ඔහුගේ නිවසට ගොස් ඇති බවත්, එම සැකකරුට අදාළ සී.සී.

ටී.වී. දර්ශන පෙන්වා ඇති බවත්, එහිදී එම ඡායාරූපවල සිටින්නේ තමා බවට ඔහු විසින් පිළිගෙන ඇති බවත්, අපරාධය සිදු වූ අවස්ථාවේ දී ඔහු ඇඳ සිටි අත්කොට කොළරය සහිත රෝස පැහැති ටී ෂර්ට් එක හා යටි කයට ඇඳ සිටි කළුපාට සරමේ කහපාට කොටු (දිග අතට) සහ හරස් අතට ඉරි සහිත වාටිය උඩ සහ එම කෙළවරේ කහපාටට හුරු දාරයක් සහිත සරම ද, එම පුද්ගලයා විසින් අපරාධය සිදු වූ අවස්ථාවේ හිසට පැළඳ සිටි රතු පැහැති JOCKEY යනුවෙන් තුන් වතාවක් සඳහන් ඉනට යොදන ලද ඉලාස්ටික් පටිය සහිත යට ඇඳුම එම පුද්ගලයා විසින් තමාට ගෙනවිත් දුන් බවත්, ඒ අනුව සැකකරු (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා)ට රුපියල් 1,451,963/-ක් වටිනා වී පටවා තිබූ අංක NCLF 6749 දරණ ඉසුසු 350 වර්ගයේ ලොරි රථය වී සමඟ සොරකම් කිරීමේ චෝදනාව කියා දී 2024.03.21 වන දින පැය 16.15ට අත්අඩංගුවට ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පාර්ශව කැඳවා කොමිෂන් සභාවේදී 2024.09.03 වන දින පැවති පරීක්ෂණයේදී මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා ප්‍රකාශ කර ඇත්තේ, 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී. රත්නායක යන අය විසින් සී.සී.ටී.වී.දර්ශන මගින් ලබා ගත් ඡායාරූප තමාට පෙන්වන ලද බවත්, එම ඡායාරූපවල සිටින්නේ තමා බව පිළිගත් බවත් ය.

තවද, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය කියා සිටින්නේ, තමාව අත්අඩංගුවට ගැනීමෙන් පසු උප සේවය වෙත බාරදුන් බවත්, පසුව ඔහුව සිර මැදිරියෙන් එළියට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානයේ උඩ තට්ටුවට රැගෙන ගොස් තමාට පහරදී වධහිංසාවක් සිදුකළ බවත්, මෙම වධහිංසාව සිදුකරන ලද්දේ 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා වන බවත් ය. 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් බටයකින් තම පිටට පහරදුන් බවත්, පොතක් ගෙන ඔළුවට පහරදුන් බවත්, පුටුවක වාඩි කරවා තම ඔළුව මේසයට ඇන්න බවත්, තවත් වරකදී තම ඔළුවෙන් අල්ලා එහි තිබූ කණුවක ඔළුව ඇන්න බවත්, එවිට තම නළල වැදුනු බවත්, තරප්පු පෙළ ළඟ ඇති කොරිඩෝව ළගට රැගෙන ගොස් පොතක අත්සන් කරන්න කියමින් පරුෂ වචනයෙන් බැන වදිමින් පයින් ගැසූ බවත්, තමාට පයින් ගසන විට ඇස් දෙක නොපෙනී ගිය බවත්, එවිට කුමන ස්ථානයකට වැටුනේද කියා තමා නොදන්නා බවත් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය විසින් ප්‍රකාශ කර ඇත.

වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.21 වන දින පැය 22.25ට පිටුව 216 සහ ඡේදය 90 යටතේ යොදා ඇති සටහන අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පඩි පෙළේ ගමන් කිරීමේදී පහලට පැන තුවාල සිදුකර ගෙන ඇති බවට සටහන් යොදා වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වැලිකන්ද රෝහල වෙත රැගෙන ගොස් ඇති බව පෙනී යයි.

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයට අදාළ වෛද්‍ය වාර්තාවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවන්ට අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය 2024.03.21 වන දින රාත්‍රී 10.30ට පමණ වැලිකන්ද රෝහල වෙත රැගෙන ගොස් ඇති බවත්, එදිනම රාත්‍රී 11.45ට අනුරාධපුර රෝහලට ඇතුලත් කර ඇති බවත්, එහිදී ඔහුගේ හිසට ශල්‍ය කර්මයක් සිදු කර ඇති බවත්, 2024.03.22 වන දින අනුරාධපුර රෝහලෙන් ඔහුව පොළොන්නරුව රෝහලෙහි දැඩි සත්කාර ඒකකය වෙත මාරු කර යවා ඇති බවත්, 2024.03.22 වන දින ප.ව. 1.11ට පොළොන්නරුව රෝහල වෙත ඇතුළත්ව ඇති බවත්, 2024.03.22 වන දින සිට 2024.04.27 වන දින දක්වා එම රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, අංක 577/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය 2024.04.22 වන දින ප.ව.3.00ට අධිකරණ වෛද්‍යවරයා විසින් පරීක්ෂාවට ලක් කර ඇත. මෙම අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසය යටතේ රෝගියා පරීක්ෂා කරන අවස්ථාවේ දී රෝගියා සිහිකල්පනාව වෙනස් වූ මට්ටමක සහ නිදිමත තත්ත්වයක සිටි බැවින් රෝගියාගේ එනම්, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ බිරිඳ විසින් ලබාදී ඇති තොරතුරු සටහන් කර ඇති බව පෙනී යයි. (History was given by wife (P.K.G. Nilanthi) as patient was in altered level of consciousness and drowsy state.)

ඒ අනුව රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසය, පහත පරිදි සටහන් කර ඇත.
"She stated that her husband was taken in to police custody by police officers of Welikanda police station on 21/03/2024 at about 3.30pm at her house, saying that they need to take statement from husband with regard to missing paddy seeds pack at the "Rathna rice mill".

Furthermore she stated that her relation brother informed her that her husband was admitted to base hospital- Welikanda and transferred to Teaching Hospital-Polonnaruwa due to head injury following jumping from the about eight feet of height at the police station.

Then her husband was transferred to Teaching Hospital- Anuradhapura for treatment on 21/03/2024 and readmitted to Teaching Hospital- Polonnaruwa on 22/03/2024."

අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල යටතේ පහත පරිදි තුවාලයේ ස්වභාවය, ප්‍රමාණය, හැඩය, දිශාව හා ස්ථානය සඳහන් කර ඇත.

- There was hair loss area measured 3cm x 1.5cm at the back side of the head. (හිස පිටුපසට වන්නට 3cm x 1.5cm ප්‍රමාණයේ කෙස් ගැලවී ගිය ප්‍රදේශයක් තිබිණි. )

- There was skin rash measured 3cmx4cm at the middle of the back of the chest.
  ( පපුවේ පිටුපස මැද 3cm x4 cm ප්‍රමාණයේ සමේ කුෂ්ටයක් විය. )

**Injuries**

**01. There was a healed craniotomy surgical wound at the right side of the head.**

There was a soft area measured 15cm x 8cm at the right side of the head with absent skull bone.

**As per the Bad Head Ticket notes,**
Patient was intubated and ventilated at the Base hospital Welikanda to support to patient's breathing due to GCS (Glasgow coma scale which is a clinical tool used to assess the patient's level of consciousness ) 07/15.
Patient was undergone neurosurgery (right fronto tempero parietal decompressive craniotomy) at Teaching Hospital Anuradhapura.

**As per the neurosurgical unit diagnosed card,**
There was a separation of the coronal suture of the skull.
There was an about 2cm right side temporal bone fracture extending posteriorly form coronal suture.
There were right side extradural hemorrhage and underlying subdural hemorrhage in parietal region.
There was a brain contusion at the temporal region of the brain.
Patient was given care at Intensive Care Unit (ICU) at Teaching Hospital- Polonnaruwa after neurosurgery."

මෙම අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් ඉහත කී තුවාල අංක 1 ලෙස සඳහන් කර ඇති හිසෙහි දකුණු පැත්තේ සුව වූ හිස් කබල විවෘත කිරීමේ ශල්‍ය තුවාලය (There was a healed craniotomy surgical wound at the right side of the head.), සාමාන්‍ය තත්ත්ව යටතේ මරණය සිදුකිරීමට ප්‍රමාණවත් තුවාලයක් බවත්, එය මොට ආයුධයකින් සිදු වී ඇති බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කොට ඇත.

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය විසින් තමා හට 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා පහරදුන් බව ප්‍රකාශ කළ ද, 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර සිටින්නේ, තමා විසින් කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත්, මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගෙන්

ප්‍රශ්න කිරීම සඳහා සිර මැදිරියෙන් එළියට ගෙන පොලිස් ස්ථානයේ උඩු මහලේ දේශන ශාලාව වෙත රැගෙන ගිය බවත්, මෙම සැකකරු රැගෙන යන විට පොලිස් සැරයන් 2952 බුද්ධික නිලධාරියා ද ගිය බවත්, මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය උඩු මහළට ගොඩවන ස්ථානයේ අත්වැට ආසන්නයේදී පහතට හැරෙනවා දුටු බවත්, එවිට වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය තරප්පු පෙළෙන් පහලට වැටුණු බවත්, උඩු මහළෙන් බිමට වැටී සිටි වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වහාම වැලිකන්ද රෝහල වෙත රැගෙන ගිය බවත්, මොහු උඩු මහළෙන් බිමට වැටුණු අවස්ථාවේදී ඔහුගේ ශරීරයේ කිසිදු තුවාලයක් නොවූ බවත්, ඔහු සිහිසුන්ව සිටි බවත් ය. මේ සම්බන්ධයෙන් 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන අය විසින් ද ඉහත කරුණු හා සමාන කරුණු දැක්වීමක් සිදු කර ඇත.

2024.03.21 වන දින උපසේවය භාරව කටයුතු කළ 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල යන අය ප්‍රකාශ කර ඇත්තේ, මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය 2024.03.21 වන දින පැය 22.15ට උපසේවයට භාරදුන් බවයි. පසුව මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් නිලධාරීන්ගෙන් දෙදෙනෙකු වන 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් දෙදෙනා පැමිණි ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය සිරමැදිරියෙන් පිටතට ගෙන පොලිස් ස්ථානයේ උඩු මහලට රැගෙන ගිය බවත්, ඒ සමඟම සැකකරු උඩින් පැන්නා යනුවෙන් කෑ ගසන හඬක් ඇසුණු බවත්, තමා එම ස්ථානය වෙත කාර්යභාර නිලධාරී සමඟ ගිය බවත්, එහිදී වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පහළට වැටී සිටිනු දුටු බවත්, මේ පිළිබඳව ස්ථානාධිපති වෙත දැන්වූ බවත්, පසුව සැකකරුව රෝහලට රැගෙන ගිය බවත් ය.

එසේම, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය සමඟ අත්අඩංගුවට ගත් බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති ආර්.පී.ජී. අසංක කුමාර වික්‍රමසිංහ යන අය විසින් 2024.03.28 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ තමා සහ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන සිටියදී පොලිස් නිලධාරීන් විසින් තමාහට පහරදෙමින් ප්‍රශ්න කළ බවත්, එච්. විමල් වසන්ත රාජා යන අයට ද පහරදෙමින් ප්‍රශ්න කළ ආකාරය තමා දුටු බවත් ය. 2026.02.11 වන දින ආර්.පී.ජී. අසංක කුමාර වික්‍රමසිංහ යන අය වෙතින් මේ සම්බන්ධයෙන් සිදු කළ වැඩිදුර විමසීමේ දී වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය තමා සමඟ පොලිස් ස්ථානයේ පහළ මාලයේ සිටියදී එක් පොලිස් නිලධාරියෙකු විසින් එච්. විමල් වසන්ත රාජා යන අයගේ පිට ප්‍රදේශයට අතින් එක් පහරක් එල්ල කළ බව තමා දුටු බවත්, එකී පොලිස් නිලධාරියාගේ නම නොදන්නා බවත්, පසුව පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් එච්. විමල් වසන්ත රාජා යන අයව තරප්පු පෙළ දිගේ ඉහළ මහලට රැගෙන ගිය බව තමා දුටු බවත්, එම අවස්ථාවේදී තමාව පහළ මාලයේ තිබූ සිර මැදිරියට දැමූ බවත්, එම ස්ථානයට ඉහළ මහල හෝ තරප්පු පෙළ නොපෙනෙන බැවින් එච්. විමල් වසන්ත රාජා යන අය ඉහළ මහලට රැගෙන ගිය පසු

කුමක් වූවාද යන්න තමා නොදන්නා නමුත්, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය "අම්මෝ..." යනුවෙන් කෑගසන ශබ්දයක් තමාට අසුණු බැවින් ඔහු හට පොලිස් නිලධාරීන් යම් පහරදීමක් සිදු කරන්නට ඇති බව තමාට හැඟෙන බවත් ආර්.පී.ජී. අසංක කුමාර වික්‍රමසිංහ යන අය විසින් දැනුම් දී ඇත.

**<u>නිගමනය</u>**

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත.

ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සලකා බැලීමේ දී වින්දිත පාර්ශවය වන එච්.විමල් වසන්ත රාජා යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ සොරකමකට අදාළව ය. දණ්ඩ නීති සංග්‍රහයේ 366 වගන්තිය යටතේ වන 'සොරකම' යන වරද නීතිය ප්‍රකාරව සංඥෙය වරදකි. ඒ අනුව ඉහත කී 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව 'සොරකම' යන වරදට සම්බන්ධ වූ හෝ එසේ සම්බන්ධ වූ බවට සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබෙන හෝ සම්බන්ධ බවට විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබෙන හෝ සම්බන්ධ බවට සාධාරණ සැකයක් පවතින යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි ය.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සියළුම ප්‍රකාශ, වාර්තා හා උධෘතයන්හි සඳහන් කරුණු සලකා බැලීමේදී රුපියල් 1,451,963.00ක් වටිනා වී පටවන ලද ලොරි රථයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් ලද පැමිණිල්ල අනුව කරන ලද විමර්ශනයේදී අනාවරණය කරගෙන ඇති තොරතුරු, සාක්ෂි හා සී.සී.ටී.වී. දර්ශන අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වරදක් කර ඇති බවට විශ්වාස කටයුතු තොරතුරු වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී ඇති හෙයින් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීම නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන

අයගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් උල්ලංඝණය වී නොමැති බව අනාවරණය වේ.

තවද, මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පොලිස් භාරයේ සිටියදී යම් වධහිංසාවකට ලක්ව තිබේ ද යන්න සලකා බැලීමේ දී, පොලිස් භාරයට ගන්නා විට වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ ශරීරයේ කිසිදු තුවාලයක් හෝ අසනීප තත්ත්වයක් නොමැතිව භාරගෙන ඇති බවට 2024.03.21 වන දින උපසේවය භාරව කටයුතු කළ 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල නිලධාරියා විසින් වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2024.03.21 වන දින පැය 17.45ට පිටුව 211 සහ ඡේදය 88 යටතේ 1 වන වගඋත්තරකරු විසින් යොදා ඇති සටහනට පහළින් යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. පසුව එදිනම එනම්, 2024.03.21 වන දින පැය 22.25ට වැලිකන්ද පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි පිටුව 216 සහ ඡේදය 90 යටතේ 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් රැගෙන යන ලද එච්. විමල් වසන්ත රාජා යන සැකකරු උපදෙස් පංතියට යන පඩිපෙළේ ගමන් කිරීමේ දී පහළට පැන තුවාල සිදු කරගෙන ඔහුව ස්ථානාධිපතිතුමා සහ පොලිස් සැරයන් 2952 බුද්ධික, උප පොලිස් පරීක්ෂක ජයවර්ධන, උප පොලිස් පරීක්ෂක වීරසිංහ නිලධාරීන් විසින් CBM 2399 ජීප් රථයෙන් වැලිකන්ද මූලික රෝහලට රැගෙන යන ලද බවයි. ඒ අනුව ඉහත කී ලෙස වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය රෝහල්ගත කිරීමට සිදුව ඇත්තේ පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී ඇති වූ යම් හේතුවක් මත බවට නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය හට මෙලෙස තුවාල සිදුව ඇත්තේ ඔහු විසින් ප්‍රකාශ කරන පරිදි ඔහු හට 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් සිදු කරන ලද පහරදීම් හේතුවෙන් ද, නැතහොත් වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති පරිදි වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය ඉහළ මාලයේ සිට පහළට පැනීම හේතුවෙන් ද යන්න සලකා බැලීමේ දී වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය විසින් පහරදීම සිදු වූ ආකාරය සම්බන්ධව ඉදිරිපත් කර ඇති කරුණු අනුව 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් තමාගේ බෙල්ලෙන් අල්ලාගෙන තමා සිටි තැන තිබූ කණුවේ තම ඔළුව ගැසූ බවත්, එම අවස්ථාවේදී ඔළුව හිරි වැටුණු බවත්, තම ඇස් දෙක නොපෙනී ගිය බවත්, පසුව උඹට අත්සන් කරන්න බැරිද යනුවෙන් පවසා තමාට පයින් ගැසූ බවත්, පයින් ගැසූ පාරට තමාව කොහේට වැටුණා ද කියා තමා දන්නේ නැති බවත්, ඊට පසු සිදුවුණු දේවල් තමා නොදන්නා බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ අංක 577/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් ඉහත කී තුවාල අංක 1 ලෙස සඳහන් කර ඇති හිසෙහි දකුණු පැත්තේ සුව වූ හිස්

කබල විවෘත කිරීමේ ශල්‍ය තුවාලය, සාමාන්‍ය තත්ත්ව යටතේ මරණය සිදුකිරීමට ප්‍රමාණවත් තුවාලයක් බවත්, එය මොට ආයුධයකින් සිදු වී ඇති බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කොට ඇත. එසේම, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයට අදාළ වෛද්‍ය වාර්තාවන්ට අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය 2024.03.21 වන දින රාත්‍රී 10.30ට පමණ වැලිකන්ද රෝහල වෙත රැගෙන ගොස් ඇති බවත්, එදිනම රාත්‍රී 11.45ට අනුරාධපුර රෝහලට ඇතුලත් කර ඇති බවත්, එහිදී ඔහුගේ හිසට ශල්‍ය කර්මයක් සිදු කර ඇති බවත්, 2024.03.22 වන දින අනුරාධපුර රෝහලෙන් ඔහුව පොළොන්නරුව රෝහලෙහි දැඩි සත්කාර ඒකකය වෙත මාරු කර යවා ඇති බවත්, 2024.03.22 වන දින ප.ව. 1.11ට පොළොන්නරුව රෝහල වෙත ඇතුළත්ව ඇති බවත්, 2024.03.22 වන දින සිට 2024.04.27 වන දින දක්වා එම රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ හිසෙහි පමණක් සාමාන්‍ය තත්ත්ව යටතේ මරණය සිදුකිරීමට ප්‍රමාණවත් තුවාලයක් පවතින බවත්, එකී තුවාලය මොට ආයුධයකින් සිදු වූවක් බවට අධිකරණ වෛද්‍යවරයා විසින් ද තහවුරු කර ඇත. 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් තමාගේ බෙල්ලෙන් අල්ලාගෙන තමා සිටි තැන තිබූ කණුවේ ඔළුව ගැසූ බවටත්, එම අවස්ථාවේදී ඔළුව හිරි වැටුණු බවටත් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය ප්‍රකාශ කර ඇත. එසේම, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයව ඉහළ මහල වෙත රැගෙන යාමෙන් අනතුරුව ඔහු වරින් වර කෑගසන ශබ්දය ඇසුණු බවට එම අවස්ථාවේ දී අත්අඩංගුවේ පසු වූ ආර්.පී.ජී. අසංක කුමාර වික්‍රමසිංහ යන අය විසින් ද ප්‍රකාශ කර ඇත. ඒ අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ හිසෙහි වූ සාමාන්‍ය තත්ත්ව යටතේ මරණය සිදුකිරීමට ප්‍රමාණවත් තුවාලය, 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් සිදු කළ පහරදීමෙන් ඇති වූවක් බව පිළිගැනීමේ වැඩි හැකියාවක් පවතින බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

එසේම, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය ප්‍රකාශ කර ඇත්තේ එලෙස පහරදීමෙන් අනතුරුව 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා තමාට පයින් ද ගැසූ බවත්, පයින් ගැසූ පාරට තමාව කොහේට වැටුණා ද කියා තමා දන්නේ නැති බවත්, ඊට පසු සිදුවුණු දේවල් තමා නොදන්නා බවත් ය. 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක, උප සේවය භාරව කටයුතු කළ 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල සහ එදින කාර්යභාර නිලධාරියා වශයෙන් කටයුතු කළ 6 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 50650 ටිකිරිබණ්ඩා යන නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පඩිපෙළ පාමුල වැටී සිටි බව දුටු බවයි.

වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පොලිස් ස්ථානයේ තරප්පු පෙළ දිගේ ඉහල මහල වෙත රැගෙන යාමේ දී ඔහුගේ දෑත් පිටුපසට කර අත්විලංගු දමා තිබූ බවත්, ඔහුගේ ආරක්ෂාවට ඔහු ඉදිරියෙන් 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා සහ ඔහු පසුපසින් 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරියා ගමන් කළ බවත් දෙපාර්ශවය විසින්ම සඳහන් කර ඇත. එලෙස දෑත් පිටුපසට කර අත්විලංගු දමා තිබියදී සහ ඔහුගේ ඉදිරියෙන් සහ පසුපසින් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සිටියදී වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති පරිදි පඩිපෙළෙහි අත්වැටට උඩින් බිමට පැනීමක් සිදු කළ බව පිළිගැනීම ගැටලු සහගත බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති පරිදි වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පඩිපෙළෙන් බිමට පැනීම සිදුවීමට වඩා ඔහුගේ ඉදිරියෙන් ගමන් කළ 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයට පා පහරක් එල්ල කිරීම හේතුවෙන් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පඩි පෙළ පාමුලට වැටීම සිදුවීමේ වැඩි සම්භාවිතාවයක් පවතින බව නිරීක්ෂණය වේ. මේ අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය පොලිස් අත්අඩංගුවේ සිටියදී 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් වධහිංසාවකට ලක් කර ඇති බව කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

<u>අමල් සුදත් සිල්වා එ. පො.ප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ හිසෙහි වූ තුවාලය මොට ආයුධයකින් සිදු වූවක් බවට අධිකරණ වෛද්‍යවරයා විසින් තහවුරු කර ඇති බැවින් එය ස්වභාවිකව ඇති වූ රෝගී තත්ත්වයක් නොවන බව සනාථ වේ. ඒ අනුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය හට එම තුවාලය ඇති වූයේ පොලිස් භාරයේ සිටියදී වන බැවින් ඔහුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් නිසි අවධානයෙන් කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවේ.

අංක ඒ 20 දරණ දෙපාර්තමේන්තු නියෝගය ප්‍රකාරව පොලීසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ නීතිරීති දක්වා ඇත. එහි දක්වා ඇත්තේ සිරභාරයේ සිටින තැනැත්තෙකු වරදකරු කරනු ලැබූ සිරකරුවෙකුගේ තත්ත්වයේ සිටින්නෙකු නොවන බවත්, ආරක්ෂා භාරය ගැන සලකා ඔහු ගැන සෑම අතින්ම සැලකිලිමත් විය යුතු බවත් සෑම පොලිස් නිලධාරියෙකුම මතක තබා ගත යුතු බවයි. වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගෙන් ප්‍රශ්න කිරීම සඳහා උපසේවය භාරව සිටි 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල නිලධාරියාට දන්වා 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් විසින් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයව පොලිස් ස්ථානයේ ඉහළ මහලට රැගෙන යාමෙන් අනතුරුව වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය හට ඇති වූ තත්ත්වයක් මත රෝහල් ගත කර ඇති බැවින්, එකී නිලධාරීන් විසින් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිසි අවධානයෙන් කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ. එම අවස්ථාවේ දී 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක යන අය ද පොලිස් ස්ථානයේ සිට ඇති බැවින් ඔහු ද වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් නොවීමට අදාළව වගකීමෙන් බැඳේ. මේ අනුව 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක, 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් ඉහත කී අංක ඒ 20 දරණ දෙපාර්තමේන්තු නියෝගය ප්‍රකාරව පොලීසියේ ආරක්ෂා භාරයේ සිටි වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට අපොහොසත්ව ඇති බැවින් එකී නීතියෙන් ස්ථාපිත ප්‍රතිපාදනයන්ගේ රැකවරණය වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයට අහිමිව ඇති බව නිරීක්ෂණය වේ. එසේ හෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක, 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ සහ 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් <u>**මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා**</u> එදිරිව <u>**පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ**</u>

<u>තවත් අය</u> (**SC FR Application No. 398/2008**) නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 3 වන වගඋත්තරකරු විසින් වින්දිත තැනැත්තා පොලිස් ස්ථානය තුළ දී වධහිංසනයන්ට භාජනය කර ඇති බව අනාවරණය වන බැවින් 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක යන අය විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්.සී.රත්නායක යන අය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ නිලධාරියා මෙම වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය අත්අඩංගුවට ගැනීමට සහභාගී වී ඇත. එලෙස අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටිය අනුව සිදු කර ඇති බැවින්, මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක වීරසිංහ නිලධාරියා හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල නිලධාරියා උප සේවය භාරව කටයුතු කර ඇති අතර, ඔහුගේ භාරයේ සිටි වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයව 5 වන වගඋත්තරකරුට දැනුම් දී ප්‍රශ්න කිරීම සඳහා 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් රැගෙන ගොස් ඇත. ඒ අනුව අදාළ සිදුවීම සිදුවන අවස්ථාවේදී වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අයගේ වගකීම 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් සතුව තිබී ඇති බැවින්, 5 වන වගඋත්තරකාර පොලිස් කොස්තාපල් 61716 අතුල නිලධාරියාට සහ එදින කාර්යභාර නිලධාරියා වශයෙන් කටයුතු කළ 6 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 50650 ටිකිරිබණ්ඩා නිලධාරියාට ද මෙම පැමිණිල්ලට අදාළව වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 3 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 39210 වීරසිංහ නිලධාරියා විසින් වින්දිත පාර්ශවය වන එච්. විමල් වසන්ත රාජා යන අය වධහිංසාවට ලක් කරමින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කර ඇති බැවින් එකී නිලධාරියාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 1994 අංක 24 දරණ වධහිංසාව කෲර අමානුෂික අවමන් සහගත සැලකීම් වැලැක්වීමේ සම්මුති පනත යටතේ නීති කෘත්‍යයක කටයුතු

කිරීම සඳහා විශේෂ විමර්ශන අංශය, ශ්‍රී ලංකා පොලිසිය මගින් විමර්ශනය කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2. 1 වන වගඋත්තරකාර වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.එම්.එස්. සී.රත්නායක සහ 4 වන වගඋත්තරකාර පොලිස් සැරයන් 2952 බුද්ධික යන නිලධාරීන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කර ඇති බැවින් එකී නිලධාරීන් විසින් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 04 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලිසිය